# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2168/6 - 2020 මාර්තු මස 25 වැනි බදාදා - 2020.03.25**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 40/1973 (I)

**(222 අධිකාරය වූ) නිරෝධායන සහ රෝග වැළැක්වීමේ ආඥාපනත**

(222 අධිකාරය වූ) නිරෝධායනය සහ රෝග වැළැක්වීමේ ආඥපනතේ 2 වන සහ 3 වන වගන්ති යටතේ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

පවිත්‍රා වන්නිආරච්චි,
සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍ය.

2020 මාර්තු මස 25 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1. කලින් කල සංශෝධිත පරිදි, 1925 අගෝස්තු මස 28 වන දින, අංක 7481 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද ධාන්‍ය ගබඩා කිරීම සම්බන්ධයෙන් වන නිරෝධායන නියෝග හා ඇන්චිලොස්ටොමියාසිස් සම්බන්ධයෙන් වන නියෝග, 1933 ජූලි මස 7 වන දින, අංක 7001 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද මහාමාරිය සම්බන්ධයෙන් වන නියෝග, 1943 අගෝස්තු මස 13 වන දින, අංක 9157 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද සමාජ රෝග නියෝග, 1946 ජුනි මස 21 වන දින, අංක 9570 දරන *ගැසට් පත්‍රයේ* පළ කරන ලද

මදුරුවන්ගෙන් බෝවන රෝග (වැළැක්වීමේ) නියෝග සහ 1960 මැයි මස 6 වන දින, අංක 12, 125 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද 1960 නිරෝධායන නියෝග යන නියෝගයන් හි "නිසි බලධරයා" යන යෙදුමෙහි අර්ථ නිරූපනය වෙනුවට පහත දක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීම මගින් ඒ නියෝග මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

"නිසි බලධරයා" යන්නෙන්, -

(අ) සමස්ත ශ්‍රී ලංකාව සම්බන්ධයෙන් වන විට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා අදහස් වේ ;

(ආ) පහත සඳහන් පරිපාලන සීමා ප්‍රදේශය සම්බන්ධයෙන් එනම් :

(i) මහ නගර සභා පරිපාලන සීමාවන් සම්බන්ධයෙන් වන විට ඒ සභාවේ නගරාධිපති හෝ ඒ සභා සීමාවේ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා හෝ අතිරේක සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා අදහස් වේ ;

(ii) නගර සභා පරිපාලන සීමාවක් සම්බන්ධයෙන් වන විට ඒ සභාවේ සභාපති හෝ ඒ සභා සීමාවේ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා හෝ අතිරේක සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා අදහස් වේ ;

(iii) ප්‍රාදේශීය සභා පරිපාලන සීමාවක් සම්බන්ධයෙන් වන විට ඒ සභාවේ සභාපති හෝ ඒ සභා සීමාවේ සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා හෝ අතිරේක සෞඛ්‍ය වෛද්‍ය නිලධරයා අදහස් වේ ;

(iv) යම් සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් හෝ පරිපාලන සභාවක් සම්බන්ධයෙන් ඒ සභාව හෝ ප්‍රාදේශීය සභාව විසින් ක්‍රියාත්මක කරන හා ඉටු කරන බලතලවලට, කාර්යවලට සහ කර්තව්‍යවලට අනුරූප වන්නා වූ හෝ සමාන වන්නා වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම සඳහා යම් කිසි නීතියකින් හෝ නීතියක් යටතේ ඇති කොට පිහිටුවන ලද කවර හෝ අධිකාරියක් ඇති විට. ඒ අධිකාරිය අදහස් වේ.

(ඇ) වරාය ප්‍රදේශයක් සම්බන්ධයෙන් වන විට, නිරෝධායන අධ්‍යක්ෂ, නියෝජ්‍ය නිරෝධායන අධ්‍යක්ෂ හෝ වරාය සෞඛ්‍ය නිලධාරි කාර්යාලයේ වෛද්‍ය නිලධරයා අදහස් වේ ;

(ඈ) ගුවන් තොටුපල ප්‍රදේශයක් සම්බන්ධයෙන් වන විට, නිරෝධායන අධ්‍යක්ෂ හෝ ගුවන් තොටුපල සෞඛ්‍ය නිලධාරි කාර්යාලයේ වෛද්‍ය නිලධරයා අදහස් වේ ;

(ඉ) යුධ, නාවික හෝ ගුවන් හමුදා ස්ථාපනයක් සම්බන්ධයෙන් වන විට ඒ ස්ථාපනයේ වෛද්‍ය නිලධරයා අදහස් වේ ; සහ

(ඊ) (ආ), (ඇ), (ඈ) සහ (ඉ) යන ඡේදවල සඳහන් නොකරන ලද කවර හෝ ප්‍රදේශයක් සම්බන්ධයෙන් වන විට ඒ ප්‍රදේශයේ දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයාගේ ප්‍රාදේශීය සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂවරයා අදහස් වේ.".

2. කලින් කල සංශෝධිත පරිදි, 1925 අගෝස්තු මස 28 වන දින, අංක 7481 දරන ගැසට් පත්‍රයේ පළ කරන ලද ධාන්‍ය ගබඩා කිරීම සම්බන්ධයෙන් වූ නිරෝධායන නියෝගවල හා ඇන්චිලොස්ටොමියාසිස් සම්බන්ධයෙන් වූ නියෝගවල, "රෝගී ප්‍රදේශයක්" යන යෙදුමෙහි අර්ථ නිරූපණය වෙනුවට පහත දක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීම මගින් ඒ නියෝග මෙයින් සංශෝධනය කරනු ලැබේ :

"රෝගී ප්‍රදේශයක්" යන්නෙන් නිසි බලධරයා විසින් යම් ප්‍රදේශයක් තමා නිශ්චය කරනු ලබන යම් කාලයක් සඳහා රෝගයක් මගින් ආසාදිත හෝ ආසාදිත වෙමින් පවතින්නේ යැයි සැක කරනු ලබන බවට ප්‍රකාශයට පත් කරනු ලබන්නේ ද එවැනි ප්‍රදේශයක් අදහස් වේ.".

3. 1 වන නියෝගයේ සඳහන් කර ඇති නියෝගවල කාර්යය සඳහා "වරාය සෞඛ්‍ය නිලධරයා" යන යෙදුමෙහි වරාය සෞඛ්‍ය කාර්යාලය සඳහා පත් කරන ලද යම් වෛද්‍ය නිලධරයකු අදහස් වේ.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.